# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1991 අංක 45 දරන
# බෙන්තොට ශ්‍රී අනුබුද්ධ මහා කාශ්‍යප දළදා පෙරහැර සංවිධායක කාරක සභාව (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1991 දෙසැම්බර් මස 17 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී**

---

1991 දෙසැම්බර් මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.**

**මිළ : ශත 60 යි.** **තැපැල් ගාස්තුව : රු. 1.00 යි.**

**1991 අංක 45 දරන බෙන්තොට ශ්‍රී අනුබුද්ධ මහා කාශ්‍යප දළදා පෙරහැර සංවිධායක කාරක සභාව (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1991 දෙසැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 48/87

**බෙන්තොට ශ්‍රී අනුබුද්ධ මහා කාශ්‍යප දළදා පෙරහැර සංවිධායක කාරක සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී අනුබුද්ධ මහා කාශ්‍යප රහතන් වහන්සේගේ පූජනීය දන්ත ධාතූන් වහන්සේ, අනුරාධපුර යුගයෙහිදී බෙන්තොට ගලපාත රජ මහා විහාරයෙහි නිදන් කොට සිංහල බෞද්ධ රාජසියන් විසින් වන්දනා කරන ලද හෙයින් සහ එම ධාතූන් වහන්සේට බෞද්ධ ජනතාව විසින් තවදුරටත් වන්දනාමාන කිරීම නොකඩවා සිදුකෙරෙන බව සහතික කිරීම අවශ්‍ය වන හෙයින් ද : — පූර්විකාව.

මහා කාශ්‍යප රහතන් වහන්සේට පූජෝපහාර පිදීම සඳහා ශ්‍රී අනුබුද්ධ මහා කාශ්‍යප දළදා පෙරහැර පැවැත්වීම පිණිස "බෙන්තොට ශ්‍රී අනුබුද්ධ මහා කාශ්‍යප දළදා පෙරහැර සංවිධායක කාරක සභාව" යනුවෙන් නම් කරනු ලැබූ සහ හඳුන්වනු ලැබූ සංගමයක් මෙතෙක් කල් පිහිටුවා තිබුණ හෙයින් සහ එකී සංගමය පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු එකී සංගමය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ ඒ සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1991 අංක 45 දරන බෙන්තොට ශ්‍රී අනුබුද්ධ මහා කාශ්‍යප දළදා පෙරහැර සංවිධායක කාරක සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) බෙන්තොට ශ්‍රී අනුබුද්ධ මහා කාශ්‍යප දළදා පෙරහැර සංවිධායක කාරක සභාවේ දැනට සාමාජිකයන්ව සිටින හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු බඳවාගනු ලබන තැනැත්තන් "බෙන්තොට ශ්‍රී අනුබුද්ධ මහා කාශ්‍යප දළදා පෙරහැර සංවිධායක කාරක සභාව" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර, පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තවද එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි ය. — බෙන්තොට ශ්‍රී අනුබුද්ධ මහා කාශ්‍යප දළදා පෙරහැර සංවිධායක කාරක සභාව සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කිරීමට අරමුණු කොටගත් පොදු පරමාර්ථ පහත දැක්වේ :—

(1) (අ) බෙන්තොට ගලපාත රජමහා විහාරයේ ධාතු ගර්භයෙහි තැන්පත් කොට ඇති මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ දන්ත ධාතූන් වහන්සේට උපහාර වශයෙන්, සෑම වර්ෂයකම උඳුවප් පුර පසළොස්වක් පොහෝ දින රාත්‍රී අවසාන මහා පෙරහැර ද සංස්ථාව විසින් නිශ්චය කරනු ලබන දින ගණනක් තුළ අනෙකුත් පෙරහැර ද පැවැත්වීම, චිරාගත සම්ප්‍රදායන්ට අනුකූලව බෞද්ධ සංස්කෘතික ලක්ෂණවලින් යුක්තව සිදු කිරීම හා ඊට අදාළ සියලු කටයුතු කිරීම ;

(ආ) "ශ්‍රී අනුබුද්ධ මහා කාශ්‍යප දළදා පෙරහැර අරමුදල" යනුවෙන් අරමුදලක් පිහිටුවීම ;

(2) ඉහත දැක්වෙන පරමාර්ථ මුදුන්පත් කරගැනීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන අරමුදල් සහ සේවා සැපයීම ;

(3) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා ඉහත පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ආනුෂංගික සහ හිතකර වෙනත් සියලු ක්‍රියාවන් සහ දේවල් කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබාගැනීම, ආධාර මුදල් හා පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනවල යෙදවීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ද ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ ඉටු කර ගැනීම සඳහා සහ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**5.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතුවන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට සහ දැරීමට නීතියෙහි ලා සංස්ථාවට බලය ඇති අතර, ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

6. (1) සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු බෙන්තොට ගලපාත රජමහා විහාරාධිපතින් වහන්සේ ඇතුළු සංස්ථාවේ නිලධාරීන් සහ ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සෙසු තැනැත්තන්ගෙන් සමන්විත වූ එකොළොස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවකින් යුත් කළමනාකරණ මණ්ඩලයක් මගින් පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී ධුර දැරූ සංගමයේ කළමනාකරණ මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

7. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද සංස්ථාවේ නිලධරයන් කළමනාකාර මණ්ඩලය සහ අනු කාරක සභා තෝරා පත් කර ගැනීම සඳහා ද සංස්ථාවේ නිලධරයන්ගේ, කළමනාකාර මණ්ඩලයේ, අනුකාරක සභාවල සහ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් ද සංස්ථාවේ කටයුතු කර ගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරමාර්ථ ඉටු කරගැනීම සඳහා ද, අවශ්‍ය වන්නා වූ සහ මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නො වන්නා වූ රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එසේ සාදනු ලැබූ රීති, එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් වෙනස් කිරීම, ඒවාට අලුතින් යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී සංගමයේ බල පැවැත් වූ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ පනත යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංගමයෙන් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි දී පැවති සංගමයේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර එදින සංගමයට අයවිය යුතු හෝ ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ සහනාගී මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**9.** සංස්ථාවේ සභාපති හා ලේකම් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. එකී තැනැත්තන් විසින් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවෙකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන් ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 370 යි. (විදේශීය) රු. 1.160 යි. කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.